# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION

සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No — 10120

ෆැක්ස් / தொலைநகல / Fax — 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site — www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail — dir.media@police.gov.lk


---

මගේ අංකය / எனது இலக்கம் / My NO — 498 /2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No — / 2024

දිනය / திக / Date — 21/03/2024 පැය 1730

## මාධ්‍ය නිවේදනය

### නව පොලිස් ඉන්ධන පිරවුම්හල විවෘත කිරීම.

පොලිස් ප්‍රවාහන කොට්ඨාසයේ අළුතින් ඉදිකරන ලද පොලිස් ඉන්ධන පිරවුම්හල විවෘත කිරීම 2024.03.21 වන දින උදෑසන **පොලිස්පති දේශබන්දු තෙන්නකෝන් මහතාගේ ප්‍රධානත්වයෙන් නාරාහේන්පිට පොලිස් ප්‍රවාහන කොට්ඨාස පරිශ්‍රයේදී** සිදුකරන ලදී.

පොලිස් ගරාජයේ තිබෙන පැරණි ඉන්ධන පිරවුම් හලට අමතරව අද දින විවෘත කරන ලද මෙම නව ඉන්ධන පිරවුම් හල මඟින් කොළඹ ප්‍රදේශයේ දෛනික රාජකාරි සඳහා ගමන් ගන්නා පොලිස් රථ වාහන වලට අවශ්‍ය ඉන්ධන සැපයීම කාර්යක්ෂමව ඉටුකිරීමට හැකියාව ලැබෙනු ඇත.

එමෙන්ම ශ්‍රී ලංකා පොලිසිය වෙත ගෙන්වන ලද නවීන වාහන සඳහා අවශ්‍ය සුපර් ඩීසල් සහ ඔක්ටේන් 95 වර්ගයේ පෙට්‍රල් බෙදාහැරීම සඳහා අවශ්‍ය පහසුකම් මෙම ඉන්ධන පිරවුම්හල මඟින් අවස්ථාව සලසා ඇත. දිවයිනේ ඕනෑම පොලිස් ස්ථානයකට අනුයුක්ත කර ඇති වාහන සඳහා මෙම ඉන්ධන හලින් ඉන්ධන ලබාගැනීමට හැකියාව පවතින අතර, ඉදිරියේදී දිවයිනම ආවරණය වන පරිදි ප්‍රාදේශීය ඉන්ධනහල් ස්ථාපිත කිරීමට අපේක්ෂා කර ඇත.

මෙම අවස්ථාව සඳහා ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති සහයක සේවා රාජිත ශ්‍රී දමින්ද මහතා, නියෝජ්‍ය පොලිස්පති ප්‍රවාහන හා සංදේශ දිසාව මංජුල සෙනරත් මහතා, කොළඹ දිසාව භාර නියෝජ්‍ය පොලිස්පති ජගත් චන්ද්‍රකුමාර මහතා, නියෝජ්‍ය පොලිස්පති පොලිස් මූලස්ථාන දිසාව බුද්ධික සිරිවර්ධන මහතා ඇතුළු නිලධාරීන් පිරිසක් සහභාගී වූ අතර එම අවස්ථාවට අදාළ ඡායාරූප කිහිපයක් මේ සමග ඔබ වෙත එවමි.




The Newly - Constructed Filling Station of Sri Lanka Police
Narahenpita
was declared open ceremoniously
Deshabandu Thennakoon,




RUPEES
LITERS
TRANSPORT DIVISION
POLICE








**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**